# වැනසෙන මහසයුරේ දැවැන්තයා



වරල් සොයා

කලකට ඉහත ලංකාවේත් අතිශයින්ම ජනප්‍රිය වූ ජෝස් (JAWS) චිත්‍රපටය තවමත් ඔබේ මතකයේ ඇතිවාට සැකයක් නැහැ. මෙම චිත්‍රපටයෙන් කථාබහ කළේ මහසයුරේ වෙසෙන දැවැන්ත මෝරෙක් පිළිබඳවයි. මෝරා තවමත් ලෝපුරා ධීවරයනගේ බියකරුම අත්දැකීම බවටත් පත්වෙලා.

ඇතැම් ගවේෂකයන්ගේ වාර්තාවලට අනුව මෝරුන් ගේ මුඛයෙහි ඇති දත් සෙන්ටිමීටරයක් පමණ දිගට වැඩෙනවා. මේ දත් ඇතැම්විට කොටින්ගේ දත්වලටත් වඩා තියුණුයි. වැඩුණු මෝරකු දිගින් මීටර හතරක් පමණ වන අතර එබන්දෙකුට පහසුවෙන්ම මිනිසෙකු ගේ බාහුවක් හෝ පාදයක් ඩැහැ ගැනීමට හැකියි.

1974 මෝරුන් පිළිබඳව ලියැවුන JAWS නම් වූ නවකතාව අතිශය සුප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂක ස්ටීවන් ස්ටිල්බර්ග් අතින් සිනමාවට නැගුණා. මෙයින් පසුවද සිදුවූයේ මෝරුන් පිළිබඳව තිබූ දැවැන්ත බිය දෙගුණ තෙගුණ වීම බවයි බොහෝ විචාරකයන් පෙන්වා දෙන්නේ.

එහෙත් මෙහි සත්‍යය සහ යථාර්ථය කුමක්ද යන්න විමසීම වඩාත් වැදගත් වෙනවා. වසරකට ලොවපුරාම මෝරුන්ගේ ප්‍රහාරවලින් මියයන පිරිස සියයක් පමණ වන බව ගණන් බලා තිබෙනවා. එහෙත් සර්පයින්, මිමැස්සන් ආදී කෘමීන් හා වල් අලින් ගේ ප්‍රහාරයන්ට ගොදුරුව ලොවපුරා මියයන මිනිසුන්ගේ සංඛ්‍යාව මෙයට වඩා අතිශය ඉහළ මට්ටමක පවතිනවා. ඒ වුනත් මෝරුන්ගේ ප්‍රහාරවලට දක්වන බිය මේ කිසිවකුටත් අවම වී නැහැ. තමන්ගේ ජීවිතාරක්ෂාවට "මරාදමන" මෝරුන් අද ලෝකයේ බොහෝ ධීවරයන් ගේ "සල්ලි මල්ලක්" බවටත් පත්වෙලා. ඇස්තමේන්තු ගත සංඛ්‍යා දත්තයන් වලට අනුව සෑම වසරකම මෝරුන් මිලියන 30 ත් මිලියන 100 ත් අතර ප්‍රමාණයක් ආහාරය පිණිසත් වරල් ලබාගැනීම පිණිසත් තවත් නොයෙකුත් දේ ලබා ගැනීම උදෙසා මරාදමනු ලබනවා. විශේෂයෙන් ම මෝරුන්ගේ හකුපාඩාවලට බටහිර යුරෝපයේ අතිවිශාල ඉල්ලුමක් තිබෙනවා. (බොහෝ නිවෙස්වල ගෘහ අලංකරණය සඳහා උපයෝගීකර ගන්නා මෙබඳු හකුපාඩාවක් ඇමෙරිකානු ඩොලර් 10,000 ක් තරම් ඉහළ මිලකට අලෙවි වනවා. මේ නිසා මේ සල්ලි මල්ල වෙනුවෙන් මෝරුන් දිගින් දිගටම සමූලඝාතනයට ලක්වෙමින් තිබෙනවා. අලුත්ම ගවේෂණවලට අනුව මෝරු බහුකාර්යය සම්පතක්. මෝරුන්ගේ ශරීර අභ්‍යන්තරයේ පවත්නා ද්‍රව්‍යයන් උපයෝගී කොට ගෙන සුවඳ විලවුන්, ලිහිසි තෙල් යනාදිය ද නිෂ්පාදනය කළ හැකිය.

මේ අලුත් ගවේෂණ නිසාත් ඒවායේ හෙළිදරව් නිසාත් මෝරුන් දිගින් දිගටම ධීවරයන් ගේ ඉලක්ක බවට පත් ව තිබේ.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය ප්‍රකාශ කරන ආකාරයට එක් මිනිසෙකු මෝරකුගේ ප්‍රහාරයෙන් මියයන විට මෝරුන් මිලියන හයක් පමණ ඒ වන්දිය තම ජීවිතයෙන් ගෙවා දමති.



මිනිසා ම වෙනුවෙන් මරණයේ අබියස

මේසා විශාල ප්‍රමාණයකින් ඉවක් බවක් නොමැති මෝර දඩයම නිසා මෝරුන්ගේ ගහණය අතිශය සීග්‍රයෙන් වඳවී යන්නට පටන් ගෙන හමාරයි. ඇතැම් සාගර විද්‍යාඥයින් අනාවරණය කරන ආකාරයට මෝරුන්ගේ වර්ධන වේගය දැනටමත් 80% කින් පහළ බැස තිබේ.

ඇමෙරිකාවේ සුප්‍රකට නැෂනල් ඕඩබන්සොසයටි නම් සංවිධානයේ සාගර වැඩසටහනට අයත් සාගර විද්‍යාඥයකු වන මෙරී චම්හි ප්‍රකාශකරන ආකාරයට මේ ලෙසට ධීවරයන් ගෙන් ඝාතනයට ලක්වන මෝරුන් රැකගැනීමට වැඩ පිළිවෙළක් හෝ ඔවුන්ව සංරක්ෂණයට වැඩපිළිවෙළක් සකසා නොගතහොත් තවත් වසර විස්සක් යන්නට පෙරාතුව මෙලෙසින් වඳවීයාමට ඇති ඉඩකඩ බැහැරකළ නොහැකිය.

මෝරුන් සාගර වංශයෙහි දිගු ඉතිහාසයකට උරුමකම් කියන බවද නොරහසකි. ඇතැම් මානව විද්‍යාඥයින්ගේ ගණනය කිරීම්වලට අනුව එය වසර මිලියන 400 ද ඉක්මවා යන්නකි. මෝරුන් ජෛව විවිධත්වයක් ද පෙන්නුම්කරන සත්ව විශේෂයකි. ඔවුන්ගේ



මහසයුරේ දැවැන්තයා

උපකුලයන් වන සෙන්ටිමීටර් 30 ක් පමණ දිගැති කුරු මෝරු, කැට් ෆිෂ් මෝරු හා තල්මස් මෝරු ප්‍රධාන තැනක් ගනී. මෙයින් තල්මස් මෝරු මීටර් 15 ක් පමණ දිගුවන බව පර්යේෂකයන් පෙන්වා දෙති.

මෝරු වෛද්‍ය විද්‍යාත්මක වශයෙන්ද මිනිසාගේ ප්‍රගමනයට මහත් මෙහෙයක් ඉටුකළ මත්ස්‍යයෙකි. මෝරුන්ගේ ශරීර අභ්‍යන්තරයේ පවත්නා කාටිලේජ පිළිකා රෝග මර්ධනයෙහි ඔසුවක් ලෙස යොදගත හැකි බව අලුත්ම ගවේෂණවලින් හෙළිව තිබෙනවා. එසේම අධික පිළිස්සුම් තුවාල ලද රෝගීන් වෙනුවෙන් ඔවුන්ට කෘත්‍රිම චර්මයක් ලෙසට මෝර සම භාවිත කළ හැකි බවත් හෙළිදරව් වී තිබෙනවා. මෝර අක්මා තෙල්වල ශරීර අභ්‍යන්තරයේ සුදු රුධිරානු වර්ධන හැකියාවක් තිබෙන බවත් දැන් හෙළිදරව් කරගෙන තිබෙනවා. මෙම තෙල් අධික රුධිර වහන රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී වැදගත් ඖෂධයක් බවද හෙළිදරව් වී තිබෙනවා.

මිනිසාට මේසා අගනා සේවයක් කරන මෝරා වැඩිපුරම මරාදමන්නට තවත් හේතුවක් වී තිබෙන්නේ මෝර වරල් ලබාගැනීමයි. ඇමරිකාවේ මෝරවරල් කිලෝවක් ඩොලර් 50 කට පමණ අලෙවි කරගත හැකි අතර මෝර මස් කිලෝවක් අලෙවි වන්නේ ඇමරිකානු ඩොලර් එකකට පමණය. මෝරවරල් වලින් සාදගනු ලබන සුප් විශේෂ බටහිර යුරෝපා රටවල මෙන්ම ජපානයේ ද අතිශය ජනප්‍රිය ව තිබේ.

මේසා අතිවිශාල ප්‍රමාණයෙන් මෝරුන් දඩයමට ධීවරයන් යොමුවීම සමගම අනාගතයේ සාගර සමතුලිතතාව නොමැතිවීයාමේ තර්ජනයක් ඉස්මතුවීම වළක්වා ගත නොහැකි බව දැනටමත් සාගර විද්‍යාඥයින් අනතුරු අඟවා තිබෙනවා. ❑

**(නිව්ස්වීක් ඇසුරෙනි.)**

**ඩබ්ලිව්. ඒ. සරත්චන්ද්‍ර**